# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 09/2016

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 ජුනි මස 21 වැනිදා

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**විශ්වවිද්‍යාල පද්ධතියෙහි අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරුවල පුරප්පාඩු පිරවීම**

ඉහත කරුණ සම්බන්ධව 2015.03.11 දිනැති අංක යූජීසී/එච්ආර්/5/1 දරන ලිපිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. වර්තමානයෙහි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණිවල තනතුරු වෙනුවට කළමනාකරණ සහකාර තනතුරු පමණක් අනුමත කිරීම යන කරුණ හේතු කොට ගෙන පරිගණක යෙදවුම් සහකාර, ලිපිකරු, යතුරුලේඛක, ලඝුලේඛක තනතුරු දරන සේවකයන්ගේ ස්ථාන මාරුවීම් ඉල්ලීම්, කළමනාකරණ සහකාර සේවක සංඛ්‍යා පුරප්පාඩු සඳහා සළකා බැලීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමැතිය ලබා දී ඇත.

03. ඒ අනුව, ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණිවල සේවකයන් විසින් ඉදිරිපත් කර ඇති ස්ථාන මාරුවීම් ඉල්ලීම්, අදාළ උසස් අධ්‍යාපන ආයතන/ ආයතන එවැනි අයදුම්කරුවන් පිළි ගැනීමට කැමැත්තක් දක්වන්නේ නම් පමණක් කළමනාකරණ සහකාර තනතුරෙහි ඇති පුරප්පාඩු සඳහා සළකා බැලීමට හැකි බව 2016.05.26 දින පැවැති සිය 941වන සභා වාරයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

04. 2015.03.11 දිනැති ලිපියෙහි විධිවිධාන නො වෙනස්ව පවතිනු ඇත.

05. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

පිටපත්:

1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් / සහකාර ලේඛකාධිකාරීවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. ප්‍රධාන අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය යූජීසී/එච්ආර්/5/1